# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ඖෂධ හිඟය සහ වෛද්‍ය හා සෞඛ්‍ය සේවක හිඟය
### மருத்துவர்கள், சுகாதாரப் பணியாளர் பற்றாக்குறை மற்றும் மருந்து பற்றாக்குறை
### SHORTAGE OF MEDICINES AND DEARTH OF DOCTORS AND HEALTH WORKERS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් මා මේ ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමනි, මානව සම්පත නිසි පරිදි කළමනාකරණය නොකිරීම හේතුවෙන් අද වන විට සෞඛ්‍ය පද්ධතිය බිඳ වැටීමේ බරපතළ අවදානමක් මතුව තිබෙනවා. දැනටමත් සේවයේ යෙදී සිටින වෛද්‍යවරු පූර්ව දැනුම් දීමකින් තොරව සේවය හැර යෑම ද පසුගිය දිනවලදී මාධ්‍ය මඟින් වාර්තා වුණා. එමෙන්ම, දැනට විදෙස්ගතව පුහුණුව ලබන විශේෂඥ වෛද්‍යවරු මෙරට ස්ථිර සේවයට එක් නොවී පූර්ණ කාලීනව විදෙස්ගතව සිටීමට ක්‍රියා කිරීම, නවක වෛද්‍යවරු සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ පශ්චාත් වෛද්‍ය උපාධිය හැදෑරීමෙන් වැළකී සිටීම වැනි කරුණු හේතුවෙන් මෙරට විශේෂඥ වෛද්‍යවරු ඇතුළු සමස්ත වෛද්‍යවරුන්ගේ හිඟයක් බරපතළ ලෙස ඇති වෙමින් පවතී.

මේ සඳහා රජය කඩිනමින් විසඳුම් ලබා දීමට ඉදිරිපත් නොවුණහොත් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් දිවයින පුරා සමානාත්මතාවකින් යුක්තව ලබා දීම ගැටලුසහගත වෙනවා. එබැවින්, වෛද්‍යවරුන්ට සේවයේ යෙදීම වෙනුවෙන් තෘප්තිමත්භාවයක් ඇති කළ හැකි ආකාරයේ විධිමත් වැඩ පිළිවෙළක් රජය කඩිනමින් දියත් කළ යුතු වෙනවා.

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්න මම ගරු ඇමතිවරයා වෙත යොමු කරනවා.

01. මෙරට අත්‍යවශ්‍ය ඖෂධ රැසක හිඟයක් අද වන විටත් පවතින බව රජය පිළිගන්නේද? එසේනම්, ඒ මොනවාද? ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොවූ ඖෂධ හදිසි මිලදී ගැනීම් යටතේ මෙරටට ගෙන්වනු ලබන්නේද? එසේ ගෙන්වනු ලබන්නේ අත්‍යවශ්‍ය ඖෂධ පමණක්ද? එසේ නම්, එම ඖෂධවල තත්ත්වය - quality, ආරක්ෂාකාරී බව - safety - සහ සඵලත්වය - efficacy - පිළිබඳව රජයට සහතික විය හැකිද? නොඑසේ නම්, ඒ පිළිබඳව වගකීම දරන්නේ කවුරුන්ද?

02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සපයනු ලබන ඖෂධ වෙනුවෙන් සැපයුම්කරුවන්ට කළ යුතු ගෙවීම් ප්‍රමාදවීමක් සිදු වන්නේද? එසේ නම්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සැපයුම්කරුවන් වෙත ලබා දිය යුතු හිඟ මුදල් ප්‍රමාණය කොපමණද? එම මුදල් කඩිනමින් පියවීමට රජය කටයුතු කරන්නේද? එසේ නම්, ඒ කවදා වන විටද? සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අත්‍යවශ්‍ය ඖෂධ ගෙන්වීම සඳහා කොපමණ මුදලක් වෙන් කර තිබේද? එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඖෂධ ගෙන්වීම සඳහා වෙන් කර ඇති සමස්ත මුදලෙන් කොපමණ ප්‍රතිශතයක්ද? අත්‍යවශ්‍ය නොවන ඖෂධ ගෙන්වීම සඳහා මීට වඩා මුදලක් රජය වැය නොකරන්නේද?

03. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභා පනත අහෝසි කර නව පනත් ගෙන ඒමේ සූදානමක් රජය සතුව තිබේද? දැනට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදුවන අක්‍රමිකතා සහ වංචා වළක්වාලීමට රජය කළ යුත්තේ කඩිමුඩියේ නව පනත් ගෙන ඒම නොව, පවතින පනත් සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීම නොවේද?

04. මෙරට රජයේ සමස්ත රෝහල් පද්ධතිය තුළ දැනට සේවයේ නියුතු වෛද්‍යවරු සංඛ්‍යාව සහ හිඟ වෛද්‍යවරු සංඛ්‍යාව පිළිබඳ සවිස්තර වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද? වෛද්‍යවරු හිඟයක් පවතින්නේ වැඩි වශයෙන් කුමන ක්ෂේත්‍රවලද? පසුගිය වසරේදී -2022දී- හා මෙම වසරේ පසුගිය මාස කිහිපය තුළදී කොපමණ වෛද්‍යවරු සංඛ්‍යාවක් විදෙස්ගත වී තිබේද? විදෙස් ගතවීම නිසා කොපමණ විශේෂඥ වෛද්‍යවරු පිරිසකගේ සේවය මෙරටට අහිමි වී තිබේද? ඒ කුමන ක්ෂේත්‍රවලද? සෞඛ්‍ය අමාත්‍යාංශයට පූර්ව දැනුම්දීමකින් තොරව විශේෂඥ වෛද්‍යවරු විදෙස්ගත වී ඇති බවට වාර්තා වී තිබේද? ඒ කොපමණ සංඛ්‍යාවක්ද? පූර්ව දැනුම් දීමකින් තොරව විදෙස්ගත වන වෛද්‍යවරු සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද? මේ නිසා රෝහල්වල කටයුතු සඳහා සිදුවන බාධා වළක්වා ගැනීමට රජය පියවර ගෙන තිබේද? ඒ කෙසේද?

ගරු කථානායකතුමනි, බුද්ධිගලනය පිළිබඳව අපි කථා කළේ අද ඊයේ නොවෙයි, මීට මාස ගණනාවකට පෙරයි. හැබැයි, මුලදී මේ පිළිබඳව විධිමත් විසඳුම් රැසකට රජයට ප්‍රවේශ වන්න ඉඩකඩ තිබුණා. නමුත්, දැන් වෙන්නේ මොකක්ද? වෛද්‍ය ක්ෂේත්‍රයේ විශාල පිරිසක් රට හැර ගියාට පස්සේ ඒක වළක්වාලන්න කියා යම් යම් පියවර දැන් ඉදිරිපත් කරනවා. ඒවා වැරැදියි කියනවා නොවෙයි. මෙතැනින් හරි තමුන්නාන්සේලා ජාමෙ බේරා ගන්න ඕනෑ. නමුත් ඇයි, මේ නිවාරණ ක්‍රියාවලිය මීට මාස කිහිපයකට පෙර ක්‍රියාත්මක කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රමුඛ රජය උත්සුක නොවුණේ කියන එක මම අහන්න කැමැතියි.

05. පවතින වෛද්‍යවරුන්ගේ හිඟය සම්පූර්ණ කිරීම සඳහා විදෙස් රටවලින් වෛද්‍යවරු ගෙන්වීමේ සැලසුමක් රජය සතුවේද? අත්‍යවශ්‍ය ඖෂධ ගෙන්වීමට ඩොලර් හිඟයක් පවතින රටකට විදෙස් රටකින් වෛද්‍යවරු ගෙන්වීම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි දෙයක් නොවන බව රජය නොදන්නේ ද? රජය කළ යුත්තේ නව වෛද්‍යවරුන් සේවයට එක් කිරීමත්, සේවයේ යෙදී සිටින වෛද්‍යවරු මෙරට රඳවා තබා ගැනීම සඳහා ඔවුන් දිරිමත් කිරීමේ විධිමත් වැඩ පිළිවෙළක් කඩිනමින් දියත් කිරීමත් නොවේද? එසේ නම්, ඒ සඳහා රජය මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ඒ වාගේම අපි විශ්වාස කරනවා, වෛද්‍ය ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩ පිළිවෙළෙහි යම් කිසි පැහැදිලි වෙනසක් වෙන්න ඕනෑ කියලා. එය ප්‍රගතිශීලීව වෙන්නත් ඕනෑ. සම්ප්‍රදායානුකූල රාමුවකට කොටු වෙලා පසුගිය කාලයේ SAITM වැනි විශ්වවිද්‍යාල ඉදිරියට එනවාට සමහරු විරුද්ධ වුණා. ඒ යල් පැන ගිය ක්‍රම වෙනුවට අලුතින් මේ රටේ වෛද්‍යවරු බිහි කිරීම සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වෛද්‍ය අධ්‍යාපනයේ විකල්ප විසඳුම් ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද, නැද්ද?

මම ඒ කාරණයට තවත් දෙයක් එකතු කරන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනයට තර්ජනයක් නොවන ආකාරයට මේ විකල්ප විසඳුම් ලබා දිය යුතුය කියන එකයි අපේ මතය. ඒ කියන්නේ නිදහස් අධ්‍යාපනය පලුදු කරලා, විනාශ කරලා, වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට විකල්ප විසඳුම් ලබා දීම නොවෙයි අපි එයින් අදහස් කරන්නේ. නිදහස් අධ්‍යාපනය රකිමින්, එය ආරක්ෂා කරමින් විකල්ප විසඳුම් ලබා දිය යුතුයි.

06. වෛද්‍යවරුන් සහ සීමාවාසික වෛද්‍යවරුන් සඳහා සුදුසු නව වැටුප් ව්‍යුහයක්/දීමනාවක් ලබා දිය නොහැක්කේද? මොකද, මේකත් බරපතළ ලෙස බලපානවා, වෛද්‍යවරු මෙරට රඳවා තබා ගැනීමේ ප්‍රශ්නයට.

දීප ව්‍යාප්තව සේවය කරනු ලබන වෛද්‍යවරුන්ගේ නේවාසික පහසුකම්, ප්‍රවාහන පහසුකම් ඉහළ නැංවීම කෙරෙහි රජයේ අවධානය යොමු වී තිබේද? එසේ නම්, මේ සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවර කවරේද?

07. වෛද්‍යවරු පමණක් නොව, අද වන විට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ හෙද හෙදියන්, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයන් - Medical Laboratory Technologists, ඖෂධවේදීන් - Pharmacists, ඖෂධ විශ්ලේෂකවරු - Pharmaceutical Analysts - ඇතුළු බොහෝ සෞඛ්‍ය වෘත්තිකයන් ප්‍රමාණවත් පරිදි නොසිටීම හේතුවෙන් රසායනාගාර සහ රෝහල් පරිශ්‍ර තුළ බොහෝ කාර්යයන් අඩපණ වී ඇති බව රජය නොදන්නේද? මෙම ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය නිලධාරීන් කඩිනමින් පුරවාලීමට රජය කටයුතු කරන්නේද? එසේ නම්, ඒ කවදා ද?

08. අදටත් රජයේ රෝහල් පද්ධතිය තුළ CT scan යන්ත්‍ර, MRI යන්ත්‍ර, Cath Lab යන්ත්‍ර වැනි බොහෝ යන්ත්‍ර සූත්‍ර නිසි පරිදි නඩත්තුවීමක් සිදු නොවන නිසා ඒවා අබලන් තත්ත්වයේ පසුවන බව රජය දන්නේද? ඒ සේවා ගිවිසුම් නිසි පරිදි යාවත්කාලීන කිරීමට රජය කටයුතු නොකරන්නේ මන්ද? මෙමඟින් සිදු වෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය බර වැඩිවීමක් නොවේද?

09. මෙරට වෛද්‍ය පීඨවල කොපමණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් අධ්‍යයන කටයුතුවල යෙදී සිටීද? වෛද්‍යවරුන්ගේ විදෙස්ගතවීම පීඨවල ඉගැන්වීම් කටයුතු සඳහා අහිතකර අන්දමින් බලනොපාන්නේද? ඒ සඳහා රජය ලබා දෙන විසඳුම් කවරේද?

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, දැන් සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කර තිබෙන බව. හැබැයි, අවශ්‍ය පහසුකම් නැහැ. භෞතික සම්පත් වාගේම මානව සම්පතත් නැහැ. එතකොට ගුණාත්මකභාවයෙන් හෙබි වෛද්‍ය සිසු පරපුරක්, වෛද්‍ය පරපුරක් බිහි කරන්නේ කොහොමද? ඒ කාරණය පිළිබඳවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

මේ ප්‍රශ්නයට අදාළව තවත් වැදගත් කාරණයක් ඔබතුමාට මතු කරනවා. මට ඒ සඳහා අවසර ලබා දෙන්න, ගරු කථානායකතුමනි. මොකද, ඒක වෛද්‍යමය පැත්තෙන්, සෞඛ්‍යමය පැත්තෙන් බොහොම බරපතළ කාරණයක්.

ගරු ඇමතිතුමනි, Meningococcal vaccine එක පිළිබඳව ඔබතුමාත් දන්නවා. අපට ආරංචි වන ආකාරයට Meningococcal vaccine එක මාස 12ක පමණ කාලයක් තිස්සේ නැහැ. එහෙම නැත්නම් ඒවායේ ඌනතාවක් තිබෙනවා. අපට ලැබිලා තිබෙන ආරංචිවලට අනුව අදටත් මේ ඌනතාව තිබෙනවා. ඔබතුමාත් දන්නවා, මේක වැදගත් vaccine එකක් බව. විශේෂයෙන්ම හජ් වන්දනාවේ යනකොට Hajj pilgrimsලාට අනිවාර්යයෙන්ම මේ vaccine එක අවශ්‍ය වෙනවා. Meningococcal vaccine එකේ ඌනතාව නිසා ඇතිවන බරපතළ ගැටලුව විසඳන්න ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද? මේ වෙනකොට විශේෂයෙන්ම meningitis outbreak එකක් Galle Prison එකේ ඇති වෙලා තිබෙන බව ඔබතුමාත් දන්නවා. අපට ලැබුණු ආරංචිවලට අනුව WHO එකෙන් Meningococcal supply එකක් ලැබිලා තිබෙනවා. ඒ ගැන කියන්න මම හරියටම දන්නේ නැහැ. නමුත්, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් කරුණු තහවුරු කරන්න පුළුවන්. හැබැයි, ඒක clear කර ගන්න සෞඛ්‍ය අමාත්‍යාංශය තවමත් අපොහොසත්වෙලා තිබෙනවා කියන ආරංචියත් අපට ලැබුණා. මම ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහිත් යොමු කරවන්න කැමැතියි. මම දන්නවා, එක පාරටම මේ කාරණයට උත්තරයක් දෙන්න බැරි වුණත්, අඩු ගණනේ හෙට දිනයේදී හෝ මේ meningitis සඳහා උපයෝගී කර ගන්න Meningococcal vaccine එක පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මේ ගරු සභාවට ඔබතුමා ලබා දේවි කියලා. එය ලබා දෙන්න කියාත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමාගේ අවසරය පරිදි මේ කාරණයත් කියන්න පුංචි අවස්ථාවක් මම ඉල්ලනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා මේ ගරු සභාවේ සිටියේ නැහැ. ඇත්ත වශයෙන්ම ඔබතුමා නොසිටි අවස්ථාවේ සිදු වුණු ක්‍රියාකාරකම් නිසා ගරු මන්ත්‍රීවරුන් දෙපළකට අද දවසේ සභා ගර්භයට එන්න එපා කියලා ඔබතුමා තීන්දුවක් ගත්තා. මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ රජයේම නියෝජ්‍ය ඇමතිවරයෙක් ප්‍රකාශ කරනවා, වරායේ අක්කර 13ක් අඩු තක්සේරුවට විකුණලා කියලා. එතකොට ඒ ගොල්ලන්ට මේ සභා ගර්භයේ ඉන්න පුළුවන්ද? අසූචි පොහොර වාර්තාව තවමත් COPE එකේ සාකච්ඡාවට භාජන කරලා නැහැ, අවුරුද්දක් ගිහිල්ලාත්. අසූචි පොහොර ගනුදෙනු, හොර පොහොර ගනුදෙනු, රජයේ මුදල්, රජයේ සම්පත් මංකොල්ල කාලා, හොරා කාලා වුණත්, ඒවා විභාගයට ගන්නෙත් නැතුව යහතින් මේ සභාවේ ඉන්නවා.

ඒ වාගේම, මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ සභාවේ මහජන මන්ත්‍රීවරයෙක් නිලධාරියෙකුගේ නමක් සඳහන් කරලා - අධිකාරි කියන මහත්මයාගේ නම සඳහන් කරලා- වැරදි චෝදනාවක් එල්ල කළා. හොඳට මතක තබා ගන්න, ඒ අධිකාරි මහත්මයා ආරක්ෂා කරන්න අපි ඉන්නවා. මහ ලේකම්තුමියටත්, මහ ලේකම්තුමියගේ කාර්ය මණ්ඩලයටත් අපි කියනවා, කරුණාකරලා මේ මන්ත්‍රීවරුන් එල්ල කරන තර්ජන ගර්ජනවලට ඔබලා යටත් වෙන්න එපා කියලා. ඒක ඔබලාගේ වගකීම නොවෙයි. හොඳට මතක තබා ගන්න අපි හොඳ විපරමින් ඉන්නවා, ඒ අය පළිගැනීම්වලට ලක් කරනවාද නැද්ද කියන කාරණාව සම්බන්ධයෙන්. ඒ වාගේම අපි දැක්කා ගරු කථානායකතුමනි, මේ සභාවේ ප්‍රශ්න කරනකොට ඇමතිවරුන් පැනලා යනවා. උත්තර දෙන්න කොන්දක් නැහැ; කශේරුකාවක් නැහැ; අවබෝධයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොළයක් නැහැ; බුද්ධියක් නැහැ; බයයි. මේ *[බාධා කිරීම්]* ඇමතිවරුන්ට මම කියනවා, සභාවේ ඉඳගෙන කොන්ද කෙළින් තබා ගෙන උත්තර දෙන්න කියලා. *[බාධා කිරීම්]* ඒ ගොල්ලෝ ඉන්නේ පැනලා යන්න නොවෙයි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහන්නේ නැතුව -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි, හරි. මගේ ඉදිරිපත් කිරීම අවසන්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මේ තර්ජනය කිරීම්වලට අපිත් බය නැහැ, ගරු කථානායකතුමනි.

විපක්ෂ නායකතුමාට කොන්දක් නැති බව මුළු රටම දන්නවා. වෙනත් නායකයන් ඔය විධියට කථා කරන කොට අපි කිසිම කෙනෙකුට තර්ජනයක් කළේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඉක්මනින් කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඇත්තටම අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ, අපි කථා කළ යුතු නිලධාරින් කවුද, කථා නොකළ යුතු නිලධාරින් කවුද කියලා අපට නම් කරලා කියන්න කියලායි. මොකද, අපට මන්ත්‍රීවරුන් හැටියට මේ පාර්ලිමේන්තුවේ ඉන්න නිලධාරින්ගෙන් යම් තොරතුරක්, ලිය කියවිල්ලක් ගත හැකියි නේ, ගරු කථානායකතුමනි. එසේ ගත්ත නිලධාරියා තමයි අධිකාරි කියන මහත්මයා. එතුමා ඒ කාර්යය කළා. *[බාධා කිරීම්]* එතකොට ගරු කථානායකතුමනි, දැන් මේ රටට ඇවිල්ලා ඉන්නවාලු ISIS සංවිධානයේ බෝම්බකරුවන්. ඒක වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා දන්නවා. හැබැයි, ඒ අය අත් අඩංගුවට ගත්තේ නැත්නම් තවත් බෝම්බ ප්‍රහාරයක් වෙලා මිනිස්සු මැරෙයි. ඒක ආණ්ඩුවක් ගන්න කරන තවත් plan එකක්ද කියලා අපි අහනවා. ඒ ISIS ත්‍රස්තවාදීන් අත් අඩංගුවට ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සෞඛ්‍ය ඇමතිතුමනි, විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය මට ලැබුණේ ඊයේ සවස් වරුවේ. ඒකට මට අමාත්‍යාංශ හතරක විතර දත්ත එක්කාසු කර ගන්න තිබෙනවා. ඒ ඉතා වැදගත් ප්‍රශ්න ටිකක්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, සවිස්තරව පිළිතුරු ලබා දෙන්න මට සාධාරණ කාලයක් ලබා දෙන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් කාලය ඉල්ලන කොට අපි ඒවාට අවස්ථාව දෙනවා. හැබැයි, මම සෞඛ්‍ය ඇමතිතුමාට එක කාරණයක් කියන්න ඕනෑ. මේ අහලා තිබෙන ප්‍රශ්න පිළිබඳව ඔබතුමා හෝ ඔබතුමා යටතේ සිටින නිලධාරින් අද, මේ මොහොතේ තොරතුරු දන්නේ නැත්නම් සෞඛ්‍ය ක්ෂේත්‍රයට දෙවියන්ගේම පිහිටයි. මේ දත්ත හා තොරතුරු බොහොම සරල දේවල්. මේවා නොදැනද මේ ආණ්ඩුව කටයුතු කරන්නේ කියන එක ගැන ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා. මේක ජාතික ඛේදවාචකයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමනි, ගරු ඇමතිතුමා කාලය ඉල්ලනවා නම්, අපට දෙන්න වෙනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, මේ කාරණය. මෙතැනදී Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government මඟින් කරුණු ලබා ගන්න තිබෙනවා. ඒ වාගේම, UGC එකෙන් කරුණු ලබා ගන්න තිබෙනවා. Higher Education Ministry එකෙන් කරුණු ලබා ගන්න තිබෙනවා. එතකොට විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියන විධියට මගේ අමාත්‍යාංශයට අදාළ කරුණු ටික ගැන මට දැන් පිළිතුරු දෙන්න පුළුවන්. හැබැයි ඒක අංග සම්පූර්ණ පිළිතුරක් නොවෙයි. මට අවශ්‍ය වෙලා තිබෙන්නේ ඔබතුමාට අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දෙන්නයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ තොරතුරු අරගෙන අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දෙන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, මේ වන විටත් මම මුදල් අමාත්‍යාංශයට මේ ප්‍රශ්න යොමු කරලා තිබෙනවා, මේ සඳහා මට අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දෙන්න කියලා. UGC එකේ Chairmanට මම කථා කළා. ඉතින්, මේ තොරතුරු ලැබෙන තෙක් මට අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දෙන්න බැහැ. ප්‍රශ්නයෙන් භාගයකට මට පිළිතුරු ලබා දෙන්න පුළුවන්. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා ඒ සඳහා මට අවසරය දෙන්න කියලා මම බොහොම සාධාරණ ඉල්ලීමක් කරනවා.